# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/16 - 2013 ජූලි මස 10 වැනි බදාදා - 2013.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනිමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

පවිත්‍රා වන්නිආරච්චි,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2013 ජූලි මස 04 වැනි දින,

*උපලේඛනය*

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, සුළු කොට්ඨාසයේ අංක 475/E තලවාකැලේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ප්‍රසන්න අල්විස් විසින් මැන පිළියෙල කරන ලද අංක UKHP/ARP/010, 2011/07/20 වැනි දින දරන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති පහත සඳහන් පරිදි මායිම් වූ අක්. 0, රූඩ්. 0, පර්. 39.30ක් වූ මුළු බිම් ප්‍රමාණය.

**01. කැබලි අංක 01 - තලවාකැලේ වත්ත, ගෙවත්ත - බිම් ප්‍රමාණය පර්චස් 39.30**

| | | |
|---|---|---|
| *උතුර* | : | තලවාකැලේ වත්ත, |
| *නැගෙනහිර* | : | තලවාකැලේ වත්ත, |
| *දකුණ* | : | ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම |
| *බටහිර* | : | දුම්රිය මාර්ග රක්ෂිතය |

හිමිකම් කියන අය : නාම ලේඛණය අමුණා ඇති UKHP/ARP/010 අනුරේඛණයේ සඳහන් පරිදි.

07-755

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
1A - G 17940— 360 (2013/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*